# මහවැලිය නව මගකට හැරවූ කෘෂි ව්‍යාප්ති සේවය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ,
මහවැලි ආර්ථික ඒජන්සියේ ශස්‍ය විද්‍යාඥ,
ඒ.ඩී. පෙරේරා විසිනි

**හැඳින්වීම :-**

ශ්‍රී ලංකාවේ මෙතෙක් ක්‍රියාත්මක වූ විශාලම සංවර්ධන ව්‍යාපෘතිය වූ මහවැලි ව්‍යාපාරයේත් බලාපොරොත්තු වූ අරමුණු වූයේ

1. විදුලිබල නිෂ්පාදනය නැංවීම
2. ආහාර නිෂ්පාදනය වැඩිකිරීම
3. රැකියා අවස්ථා වැඩි කිරීම
4. ජනාවාසකරණය යන ප්‍රධාන ඉලක්ක සපුරා ගැනීමයි

අනුව මෙරටෙහි ක්‍රියාත්මක කෙරෙන කෘෂි ව්‍යාප්ති සේවය ද නැවත සමාලෝචනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නව කෘෂි ව්‍යාප්ති ක්‍රමයක් අනුගමනය කිරීම ආරම්භ කොට ඇත. මීට සමගාමීව මහවැලි අධිකාරිය ද සිය කෘෂි ව්‍යාප්ති සේවය නව මගකට යොමු කොට ඇත.

**මෙතෙක් ක්‍රියාත්මක වූ පුහුණුවීම් හා හමුවීම් ව්‍යාප්ති ක්‍රමයේදී ඉහළ සිට පහළට සැළසුම් කොට ක්‍රියාත්මක කරනු ලැබූ වැඩ සටහන්වල ඒවායේ ප්‍රතිලාභීන් වන ගොවීන් ගේ ප්‍රතිචාර පිළිබඳව වඩාත් සැලකිලිමත් නොවීමත්, කෘෂිකාර්මික නිෂ්පාදනයට බලපා ඇති අදාල නොයෙකුත් ගැටළු පිළිබඳව අවධානය යොමු කර නොතිබීමත්, විශාල අඩුපාඩුවක් විය. මෙම තත්ත්වය මග හරවා ගැනීම වස් පහළ සිට ඉහළට සැළසුම්කරණය කරනු ලැබූ කෘෂි ව්‍යාප්ති ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම දැනට ආරම්භ කොට ඇත. මේ අනුව මහවැලි ව්‍යාපාර ප්‍රදේශවල කෘෂි ව්‍යාප්තිය පිළිබඳ ප්‍රතිපත්තිය වනුයේ සහභාගීත්ව ක්‍රම වේදයක් තුළින් පවත්නා ස්වභාවික හා මිනිස් සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගනිමින් ජනපදික ගොවීන් ගේ කෘෂිකාර්මික ජීවනෝපාය ව්‍යාපාරයක් ලෙස දියුණු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන නව කෘෂි තාක්ෂණය ලබා දීමයි.**

මෙම අරමුණු අතුරින් ආහාර නිෂ්පාදනය වැඩි කිරීමේ වගකීම මහවැලි කෘෂි ව්‍යාප්ති සේවය වෙත පැවරිණ. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය වර්ෂ 1970 පමණ ආරම්භ වුවත්, එහි කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු ආරම්භ වූයේ 1976 දී මහවැලි "එච්" කලාපයෙනි. ආරම්භයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මෙම ප්‍රදේශවල කෘෂි කාර්මික ව්‍යාප්ති කටයුතු මෙහෙය වූ අතර, 1980 දී සියළුම කෘෂි ව්‍යාප්ති සේවාවන් මහවැලි අධිකාරිය යටතට පත්විය. මෙම කාලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පුහුණුවීම් හා හමුවීම් (T & V ) ව්‍යාප්ති ක්‍රමය මෙරටට හඳුන්වාදීමේ ආරම්භක අවධිය වූ අතර, මහවැලි ප්‍රදේශවල ද එම ක්‍රමය සම්බන්ධිත ගොවීන් වෙනුවට කෙත් ඇල මට්ටමේ ගොවි කණ්ඩායම් කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක කරන ලදී. මහවැලි කලාපවල ඉහළ කෘෂි නිෂ්පාදනයන්ට ප්‍රධාන වශයෙන් ඉවහල් වූයේ මෙම ව්‍යාප්ති ක්‍රමය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමයි. එහෙත් වර්ෂ කිහිපයක සිට කෘෂි කාර්මික නිෂ්පාදන වර්ධනයෙහි ස්ථගිත බවක් දක්නට ඇත. මේ තත්ත්වය ජාතික වශයෙන් ද පොදු වූවකි. මේ

**මහවැලි කෘෂිකර්ම ව්‍යාප්ති ප්‍රතිපත්තිය.**

මෙතෙක් ක්‍රියාත්මක වූ පුහුණුවීම් හා හමුවීම් ව්‍යාප්ති ක්‍රමයේදී ඉහළ සිට පහළට සැළසුම් කොට ක්‍රියාත්මක කරනු ලැබූ වැඩ සටහන්වල ඒවායේ ප්‍රතිලාභීන් වන ගොවීන් ගේ ප්‍රතිචාර පිළිබඳව වඩාත් සැලකිලිමත් නොවීමත්, කෘෂිකාර්මික නිෂ්පාදනයට බලපා ඇති අදාළ නොයෙකුත් ගැටළු පිළිබඳව අවධානය යොමු කර නොතිබීමත්, විශාල අඩුපාඩුවක් විය. මෙම තත්ත්වය මග හරවා ගැනීම් වස් පහළ සිට ඉහළට සැලසුම්කරණය කරනු ලැබූ කෘෂි ව්‍යාප්ති ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම දැනට ආරම්භ කොට ඇත.

මේ අනුව මහවැලි ව්‍යාපාර ප්‍රදේශවල කෘෂි ව්‍යාප්තිය පිළිබඳ ප්‍රතිපත්තිය වනුයේ සහභාගිත්ව ක්‍රම වේදයක් තුළින් පවත්නා ස්වභාවික හා මිනිස් සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගි කර ගනිමින් ජනපදික ගොවීන් ගේ කෘෂිකාර්මික ජීවනෝපාය ව්‍යාපාරයක් ලෙස දියුණු කිරීම හා ශක්තිමත්

කිරීම සඳහා අවශ්‍ය වන නව කෘෂි තාක්ෂණය ලබා දීමයි.

සියලුම නිත්‍යානුකූල මහවැලි ඉඩම් ලාභීන් වැඩසටහනෙහි ඉලක්ක කණ්ඩායම්වලට ගැනේ. වාරිමාර්ග පද්ධතියේ එකිනෙකට ආසන්නයේ වූ අවහැරවුම් 5-6ක වූ ගොවීන් 100ක් පමණ එක් කණ්ඩායමකට අයත් වෙයි. එක් එක් ඉලක්ක කණ්ඩායමකට පොදු වූ කෘෂිකාර්මික නිෂ්පාදනයට බලපාන කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සියළුම ගැටළු, හේතු හා විසඳුම් සහභාගිත්ව ක්‍රමවේදයක් තුළින් හඳුනා ගෙන ව්‍යාප්ති වැඩසටහන් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සිදුවේ. මේ සඳහා මහවැලි ප්‍රදේශවල කුඩාම පරිපාලන ප්‍රදේශය වන සෑම "ඒකකයක්" සඳහාම ක්ෂේත්‍ර සහකාරවරයෙකු බැගින් ඇත. එක් ක්ෂේත්‍ර සහකාරවරයෙකු සාමාන්‍යයෙන් ගොවි පවුල් 500-600 ආවරණය කරයි. මේ අනුව එක් ක්ෂේත්‍ර සහකාරවරයෙකුට 5-6ක ඉලක්ක කණ්ඩායම් සංඛ්‍යාවක් අයත් වේ.

දැනට මහවැලි ප්‍රදේශවල ප්‍රතිපත්තියක් ලෙස සහභාගිත්ව කළමනාකරණයක් තුළින් විශේෂයෙන් ජලපාලන කටයුතු හා අලෙවි කටයුතු සිදු කිරීම ආරම්භ කොට ඇත. එබැවින් කෘෂි ව්‍යාප්ති සහභාගිත්ව ක්‍රම වේදයන් තුළින් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

**ඕනෑම කෘෂි ව්‍යාප්ති ක්‍රමයක් (Extension System) යම්කිසි කාල සීමාවකට ඉලක්ක කොට සකස් කළ යුතු අතර, ඉන් පසු රටෙහි හා ගොවි ජනතාවගේ අවශ්‍යතාවයන් මත නැවත සමාලෝචනය කිරීම වැදගත් වේ. මහවැලි කෘෂි ව්‍යාප්ති වැඩ සටහන අවුරුදු 5ක් තුළදී පහත සඳහන් ඉලක්කයන් සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.**

1. **අවම නිෂ්පාදන වියදමක් යටතේ සියළුම මහවැලි කලාපවල වී නිෂ්පාදනය හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 4.8 පමණ ඉහළ නැංවීම.**
2. **එක් එක් මහවැලි කලාපවල පවත්නා විවිධ තත්ත්වයන් යටතේ භෝග විවිධාංගීකරණය උපරිම මට්ටමින් පවත්වාගෙන යෑම. මේ අනුව එක් එක් කලාපවල භෝග විවිධාංගිකරණ ඉලක්කයන් පහත දැක්වේ.**

| | |
|---|---|
| **එච් කලාපය** | **- 75%** |
| **බී හා සී කලාපය** | **- 10%** |
| **ජී කලාපය** | **- 50%** |
| **වලව** | **- 40%** |

3. **මහවැලි ගොවි බිම්වලින් අවම වශයෙන් 50%ක් සත්ව පාලන කටයුතු සමඟ ඒකාබද්ධ කිරීම.**

**ඉලක්ක කණ්ඩායම්**

සියලුම නිත්‍යානුකූල මහවැලි ඉඩම්ලාභීන් වැඩසටහනෙහි ඉලක්ක කණ්ඩායම්වලට ගැනේ. වාරිමාර්ග පද්ධතියේ එකිනෙකට ආසන්නයේ වූ අවහැරවුම් 5-6 ක වූ ගොවීන් 100ක් පමණ එක් කණ්ඩායමකට අයත් වෙයි. එක් එක් ඉලක්ක කණ්ඩායමකට පොදු වූ කෘෂිකාර්මික නිෂ්පාදනයට බලපාන කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සියළුම ගැටළු, හේතු හා විසඳුම් සහභාගිත්ව ක්‍රමවේදයක් තුළින් හඳුනා ගෙන ව්‍යාප්ති වැඩසටහන් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සිදුවේ. මේ සඳහා මහවැලි ප්‍රදේශවල කුඩාම පරිපාලන ප්‍රදේශය වන සෑම "ඒකකයක්" සඳහාම ක්ෂේත්‍ර සහකාරවරයෙකු බැගින් ඇත. එක් ක්ෂේත්‍ර සහකාරවරයෙකු සාමාන්‍යයෙන් ගොවි පවුල් 500-600 ආවරණය කරයි. මේ අනුව එක් ක්ෂේත්‍ර සහකාර වරයෙකුට 5-6ක ඉලක්ක කණ්ඩායම් සංඛ්‍යාවක් අයත් වේ

**ව්‍යාප්ති වැඩ සටහන**

සෑම ක්ෂේත්‍ර සහකාරවරයෙක්ම සෑම කන්නයක් සඳහාම එක් එක් ඉලක්ක කණ්ඩායමක් සඳහා වෙන් වූ ව්‍යාප්ති වැඩසටහනක්, එම කණ්ඩායමට පොදු වූ ගැටළු මත පදනම්ව සකස්

කරනු ලබයි. බීජ නිෂ්පාදන වැඩ සටහන්, ආදර්ශන, ක්ෂේත්‍ර දින, පුහුණු වැඩ සටහන් ආදී විවිධ ව්‍යාප්ති ක්‍රම වේදයන් මෙම ව්‍යාප්ති වැඩ සටහනට අයත් වේ.

මෙම වැඩ සටහනෙහි විශෙෂ අංගයක් වනුයේ කෘෂිකාර්මික ගැටළු සඳහා විසඳුම් සෙවීම පිණිස සරළ අත්හදා බැලීම් කිරීමට සහභාගිත්ව තාක්‍ෂණ සංවර්ධන ක්‍රම වේදයන් තුළින් ගොවීන් උනන්දු කරවීමයි. එක් එක් ඉලක්ක කණ්ඩායමක වූ ව්‍යාප්ති වැඩ සටහන් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර සහකාරවරයා සති දෙකකට වරක් නියමිත පරිදි කටයුතු කරයි.

එක් එක් කණ්ඩායම්වල හඳුනාගත් කෘෂිකාර්මික නොවන වාරිමාර්ග ඉඩම් හා අලෙවි ආදී අනෙකුත් ගැටලූ ඒ ඒ කණ්ඩායම් අයත් වන ඒකක ගොවි සංවිධාන සම්බන්ධීකරණ කමිටු ඔස්සේ මූලිකව විසඳීමට කටයුතු යොදන අතර, එසේ විසඳීමට නොහැකි ගැටලු කොට්ඨාශ හා ව්‍යාපාර මට්ටමේ සම්බන්ධීකරණ කමිටුවලට යොමු කරනු ලැබේ.

## කෘෂි ව්‍යාප්ති පරිපාලන ව්‍යුහය

වෙන් වෙන් වශයෙන් පිහිටා ඇති සෑම මහවැලි ප්‍රදේශයක්ම කලාපයක් වශයෙන් හැඳින්වෙයි. මෙම කලාපයක් නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයෙක් යටතේ පාලනය වෙයි. එක් එක් කලාපයක් පරිපාලන කොට්ඨාශ කීපයකට වෙන් කොට ඇත. එක් පරිපාලන කොට්ඨාශයකට ගොවි පවුල් 2500-5000 ක ප්‍රමාණයක් අයත් වෙයි. කොට්ඨාශයක් කොට්ඨාශ කළමණාකාරවරයෙක් යටතේ පාලනය වන අතර, සෑම කොට්ඨාශයකම ගොවි පවුල් 500 - 600ක් අයත් වන සේ ඒකකවලට බෙදා ඇත. ඒකක කළමණාකරු ඒකකයේ පෙර හා පසු පදිංචි කරවීම් සම්බන්ධ වැඩ කටයුතුවල වගකීම දරයි. ඒකක මට්ටමේ සිටින අනෙක් නිලධාරියා නම් ක්ෂේත්‍ර සහකාරවරයායි. ඔහු ප්‍රධාන වශයෙන් කෘෂි ව්‍යාප්ති කටයුතුවල යොදා ඇත. කොට්ඨාශ මට්ටමේ කටයුතුවලදී කොට්ඨාශ කළමණාකාරවරයාට සහාය වීම සඳහා කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, අලෙවි, ආයතන සංවර්ධන, ප්‍රජා සේවා ආදී එක් එක් විෂයය සඳහා නිලධාරියෙක් බැගින් ඇත. ව්‍යාපාර මට්ටමේ නේවාසික ව්‍යාපාර කළමනාකාරවරයාට සහාය වීම සඳහා ඉහත සඳහන් එක් එක් විෂයය සඳහා නිලධාරියෙක් බැගින් ඇත. ව්‍යාපාර මට්ටමේ කෘෂිකර්ම සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කෘෂිකර්ම නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයාය. ඔහු යටතේ වී වගාව, අතිරේක භෝග වගාව හා පැලෑටි සංරක්‍ෂණය සඳහා විෂය භාර නිලධාරියෙක් ඇත. කොට්ඨාශ කෘෂිකර්ම නිලධාරියා ක්ෂේත්‍ර සහකරුවනට අවශ්‍ය වන මඟ පෙන්වීම හා ඔවුන්ගේ ව්‍යාප්ති කටයුතු අධීක්‍ෂණය සිදු කරයි.

මහවැලි ප්‍රදේශවල කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු ඉටු කිරීමේදී ඉහත දැක්වූ පරිපාලන රටාව ඉමහත් වැදගත් කමක් දරයි. විශෙෂයෙන්ම කෘෂිකාර්මික කටයුතු හා බැඳී පවත්නා වාරිමාර්ග, ඉඩම්, අලෙවි ආදී කටයුතු සියල්ල මහවැලි අධිකාරිය මගින් ඉටු කිරීමත්, ඒ ඒ කාර්යයන් සඳහා විවිධ මට්ටම්න් නිලධාරීන් සිටීමත් මෙයට හේතුවයි.

## කෘෂි ව්‍යාප්ති සේවා

මහවැලි ජනපදික ගොවීන් වෙත ප්‍රධාන වශයෙන් මහවැලි අධිකාරිය මගින් කෘෂි තාක්‍ෂණය පිළිබඳ උපදෙස් ලබා දෙයි. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොල් වගා කිරීමේ මණ්ඩලය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව වැනි අදාළ ආයතනවලින් දායකත්වය ලැබෙන අතර, එම ආයතන හා සමීප සම්බන්ධීකරණයක් මහවැලි අධිකාරිය මගින් නිරතුරුව පවත්වා ගනී.

කෘෂි තාක්‍ෂණය ගොවීන් වෙත ප්‍රධාන වශයෙන් ලබා දෙනුයේ ක්ෂේත්‍ර සහකාරවරයා මගිනි. මාසිකව නිකුත් කරනු ලබන සඟරා සහ පොත් පත්‍රිකා, පෝස්ටර් යනාදි මාධ්‍යයන් ද මේ සඳහා උපයෝගි කර ගනී.

මීට අමතරව, ගොවීන් වෙත අවශ්‍ය බීජ, පොහොර හා අනෙකුත් යෙදවුම් ලබාදීම සඳහා අදාළ අංශ සමඟ සම්බන්ධීකරණය හා සහාය වීම මහවැලි අධිකාරිය මගින් ඉටු කරයි.